# බටහිරයන්ට සේවය කරන මාක්ස්වාදියෝ

ඊනියා කොටි ගුවන්යානා ගුවන්ගත කෙරෙන්නේ ඉරණමඩුවෙන් නොවන බව පැහැදිලි ය. එහි දී ඇතැමුන් කියන්නට යෙදුණේ කොටින්ගේ ගුවන්යානා පථයක් විල්පත්තුවේ ඇති බව ය. එහෙත් විල්පත්තුවේ එලෙස ගුවන්යානා පථයක් ඉදි නොවුණු බව බොහෝ දෙනාගේ මතයට එකඟ ය. කිසිවකුට නොදැනෙන පරිදි විල්පත්තුවේ ගුවන්යානා පථයක් ඉදිකිරීමට කොටින්ට හැකි වී යැයි සිතීම උගහට ය. මේ ගුවන්යානාවලට මුහුදේ නවතා ඇති නැවකින් ගුවන්ගත වීමට වුව ද හැකි ය. එලෙස ගුවන්ගත වූ ගුවන්යානයක් විල්පත්තුව උඩින් පියාසරකිරීම අරුමයක් නො වෙයි.

පසුගිය සති කිහිපයෙහිම මේ තීරුවෙන් කරුණු දැක්වූයේ සිංහලත්වයට එරෙහිව දෙමළ ජාතිවාදයට පක්ෂව ක්‍රියාත්මකවන ජාත්‍යන්තර බලවේග සම්බන්ධයෙනි. ඒ ක්‍රියාත්මකවන්නේ කුමන්ත්‍රණයක් නම් නොවෙයි. ලංකාව ගත්කල බටහිරට මෙන් ම ඉන්දියාවට ද සිංහලත්වය ප්‍රශ්නයක් වෙයි. ඉන්දියාව (හා භාරතය) සම්බන්ධයෙන් ගත්කල එයට සිංහලයන් නොඉවසීමේ අවුරුදු දහස් ගණනක ඉතිහාසයක් වෙයි. බටහිරයන් සම්බන්ධයෙන් ඒ ඉතිහාසයට අවුරුදු පන්සියයක් පමණ වෙයි.

කොටි ගුවන්යානා යනුවෙන් හැඳින්වෙන්නේ නියම වශයෙන් ම කොටි ගුවන්යානා ද යන සැකය මේ තීරුවෙන් මුල සිට ම මතුකෙරිණි. අපට ඇත්තේ සැකයක් පමණකි. ඒ සැකය ඉතිහාසය විසින් ද ඇතිකෙරෙන්නකි. බටහිරයන් හා ඉන්දියාව මෙරට දෙමළ ජාතිවාදී ප්‍රශ්නය සම්බන්ධයෙන් ගත්කල එක්ව ක්‍රියාකරන බව පැහැදිලි ය. බටහිරට ඉන්දියාවට පමණක් නොව මෙරට කොටින්ට විරුද්ධ දෙමළ ජනයාට පවා අද කොටි අවශ්‍ය වෙයි. එයට හේතුව කොටි නොවන්නට දෙමළ ජාතිවාදයට කිසිවක් දිනාගත නොහැකි යැයි ඔවුන් සිතන බැවිනි. එබැවින් මේ කිසිවකු කොටි පැරදවීමට ලංකාවේ හමුදාවන්ට ඉඩ නො දෙනු ඇත. අද අපට මුහුණපෑමට සිදු වී ඇති ප්‍රධාන ම ප්‍රශ්නය එය වෙයි.

ජ වි පෙ හැරෙන්නට මෙරට ඇති පුහු මාක්ස්වාදී පක්ෂ ද මේ අවස්ථාවෙහි කොටි පැරදවීමට විරුද්ධ ය. පසුගිය දා බ්‍රිතානි පාර්ලිමේන්තුව ලංකාවට විරුද්ධව යෝජනාවක් සම්මත කරගනිමින් දෙමළ ප්‍රශ්නය සඳහා සර්ව පාක්ෂික පාර්ලිමේන්තු කණ්ඩායමක් පිහිටුවා මෙරට ස්වාධිපත්‍යයට එරෙහිව කටයුතු කළවිට බ්‍රිතානි පාර්ලිමේන්තුව වෙනුවෙන් කතාකිරීමට ඉදිරියට පැමිණියෝ කසිකබල් මාක්ස්වාදීහු ය. වාසුදේව නානායක්කාර මහතා ලංකාවේ ස්වෛරීභාවයට විරුද්ධව බ්‍රිතානි පාර්ලිමේන්තුව ආරක්ෂාකරමින් කියා සිටියේ එකල වියට්නාම් ප්‍රශ්නය ලංකාවේ පාර්ලිමේන්තුවේ සාකච්ඡාකළ බව ය. ඒ අතර ටෙරන්ස් පුරසිංහ නම් දේශපාලන විද්‍යාව පිළිබඳ විශ්වවිද්‍යාලයීය කථිකාචාර්යවරයා පැවසුයේ කිසිම රටක් මුළුමනින් ම ස්වාධීන නොවන බව ය.

පුරසිංහ මහතා දෙමළ ජාතිවාදය වෙනුවෙන් පෙනී සිටිය ද ඒ ආකාරයෙන් උද්‍යොගිමත්ව විශ්වවිද්‍යාලයීය ආචාර්යවරුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන්වත් පෙනී නොසිටින මාක්ස්වාදියෙකි. එවැන්නන් කිහිප දෙනකු විශ්වවිද්‍යාල පද්ධතියේ ඇති බව මම මා නොදන්නා දෙයක් නො වෙයි. මෙවැන්නන් තම දේශන ඔස්සේ සිසුන්ට දුර්මත ඉදිරිපත්කරන බව ද මම දනිමි. එහෙත් විශ්වවිද්‍යාලයීය ආචාර්යවරයකුට තම මතය සිසුන්ට කියාදීමට ඇති අයිතිය මම ප්‍රතික්ෂේප නො කරමි. (ජී එල් පීරිස් නම් බටහිර ගැති ව්‍යාජ ලිබරල්වාදී උපකුලපතිවරයා තවත් ඈදුරන් කිහිප දෙනකු සමග එකතු වී මේ අයිතිය මගෙන් පැහැරගත්විට විශ්වවිද්‍යාලයීය ආචාර්යවරුන් අති විශාල බහුතරය නිහඬ වූ බව මට කිසි දිනෙක අමතක නොවනු ඇත.) අවාසනාවකට මෙවැන්නන් බොහෝ දෙනකුට තමන්ගේ මතයක් කියා එකක් නැත. ඔවුන් ඉදිරිපත්කරන්නේ බටහිරින් හිඟාගත් කසිකබල් මත ය. කැලණිය විශ්වවිද්‍යාලයේ ද බාහිර කථිකාචාර්යවරයකු වන පුරසිංහ මහතා සමග ඉදිරිකාලයේ දී ඒ විශ්වවිද්‍යාලයේ දී ම දෙමළ ජාතිවාදය පිළිබඳ විවාදයක් පැවැත්වීමට මම අදහස්කරමි.

වාසුදේව නානායක්කාර මහතා සාදෘශ්‍යයෙන් තර්කකරයි. එහෙත් ඒ මහතා නොදන්නා කරුණක් නම් සාදෘශ්‍යය යනු ඉතාමත් දුර්වල තර්කයක් බව ය. සාදෘශ්‍යයෙන් ගෙන එන තර්කයක් බිඳ දැමීමට කළයුත්තේ ඒ සාදෘශ්‍යය ඉදිරියට ගෙනයෑම පමණකි! නානායක්කාර මහතා පෙන්නුම්කිරීමට උත්සාහ ගන්නේ වියට්නාම් ප්‍රශ්නය සම්බන්ධයෙන්

© Prof. Nalin De Silva

විවාදයක් පැවැත්වීමට ලංකා පාර්ලිමේන්තුවට හැකි වී නම් ලංකාවේ දෙමළ ජාතිවාදී ප්‍රශ්නය ගැන විවාදකිරීමට බ්‍රිතානි පාර්ලිමේන්තුවට හැකි බව ය. සාදෘශ්‍යය බොහෝවිට ගොඩ පෙරකදෝරුවන්ගේ ද තර්කයකි. නානායක්කාර මහතා නොදන්නා දෙය හෝ සැඟවීමට උත්සාහකරන දෙය හෝ නම් බ්‍රිතානි පාර්ලිමේන්තුවේ පැවැත්වුයේ හුදු විවාදයක් පමණක් නොවන බව ය. බ්‍රිතානි පාර්ලිමේන්තුව ලංකාවේ ප්‍රශ්නය විසඳීම සඳහා ඒ ගැන සොයා බැලීමට පාර්ලිමේන්තු කණ්ඩායමක් පත්කර ඇත. ඔවුහු ලංකාණ්ඩුවේ, කොට්න්ගේ හා නෝර්වේ ආන්ඩුවේ නියෝජිත පිරිසක් ලන්ඩනයට ගෙන්වීමට බලාපොරොත්තු වෙති. තමිල්සෙල්වන් නමැති ත්‍රස්තවාදියාට බ්‍රිතානි පාර්ලිමේන්තුව ඇමතීමට ඉඩදීමට යති. (බ්‍රිතානියේ කොටි තහනම ව්‍යාජයක් බව අමතක නොකළ යුතු ය. කොටි සංවිධානය තහනම් ව තිබිය දී එහි න්‍යායාචාර්ය ලෙස සැලකුණු ඇන්ටන් බාලසිංහම් කිසිම කරදරයක් නැතිව බ්‍රිතානියේ ජීවත්විය.)

ලංකා පාර්ලිමේන්තුව වියට්නාම් ප්‍රශ්නය හමුවෙහි එවැනි පාර්ලිමේන්තු කණ්ඩායමක් පත්කෙළේ නම් ඇමරිකන් ආණාඩුවට හා වියට්නාම් ආණ්ඩුවට තම නියෝජිතයන් සාකච්ඡා සඳහා කොළඹට එවන ලෙස කියා සිටියේ නම් කුමක් වීමට තිබුණි දැයි පුරසිංහ ආචාර්යතුමාට විස්තර කර දිය හැකි ද? නානායක්කාර මහතාට (හා එකල පාසල් හා සරසවි සිසුන් වූ අපට) කළහැකි වුයේ වියට්නාමයට අත නොතබනු යැයි කෑ ගැසීම පමණ ය. එහෙත් බ්‍රිතානීහු එසේ කෑ නොගසති. ඔවුහු තම ආධිපත්‍යය අප මත පටවති. අපේ ස්වෛරීභාවයට පහර දෙති. ලෝකයේ කිසිම රටකට ස්වෛරීභාවයක් නැතැයි පුරසිංහ මහතා කියයි. එහෙත් එය ඇත්තක් ලෙස පෙනෙන බොරුවක් පමණකි. ලෝකයේ සියළු රටවල් අද එකිනෙක සමග බැඳී ඇති බව තේරුම්ගැනීමට දේශපාලන විද්‍යාඥයකු විය යුතු නො වේ. එහෙත් මේ බැඳීම් සමමිතික සම්බන්ධතා නො වෙයි. ප්‍රශ්නය ඇත්තේ මේ අසමමිතික බවේ ය. පුරසිංහ මහතා දෙමළ ජාතිවාදයේ අවශ්‍යතා හා බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ යටත්විජිතවාදී අවශ්‍යතා වෙනුවෙන් නොසලකා හරින්නේ මේ අසමමිතිය ය. බටහිරයන් හා ඉන්දියාව අපට ඇතිකරන ආධිපත්‍යය අපට ඒ රටවලට ඇතිකළ හැකි නො වෙයි. අද අපට මුහුණ දීමට ඇති ප්‍රහ්නය මේ ආධිපත්‍යය හමුවෙහි අප කෙසේ ක්‍රියාකළ යුතු ද යන්න ය.

අනෙක් අතට නානායක්කාර මහතාට නොතේරෙන කරුණ නම් ඇමරිකාව වියට්නාමයට ගියේ ආක්‍රමණික හමුදාවක් ලෙස බව ය. ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත් යනු විදේශ  නො වෙයි. ලන්දේසීන් විසින් ගෙන්වනු ලැබූ පිරිසකගෙන් ප්‍රධාන වශයෙන් ම පැවතෙන පිරිසක් බ්‍රිතානීන්ගෙන් විශේෂ වරප්‍රසාද ලැබ ඒ වටප්‍රසාද අහිමි වන විට දෙමළ ජනයාට අසාධාරණයක් වන බව කියා ආණ්ඩුවට විරුද්ධව ආයුධ අතට ගෙන  සිටිති. ඒ හමුවෙහි ලංකාණ්ඩුව කළයුත්තේ කුමක් ද? සිල් ගැනීම ද? යුදේදට නැති කඩුව කොස් කොටන්නට දැයි ඇසුවේ යුද්ධය අහිමි යැයි බටහිර සමාජ විද්‍යාඥයන් ඕල්කට් බෞද්ධයන් ඇතුළු තවත් අය විසින් නම් කෙරී ඇති සිංහල බෞද්ධයන් ම බව පුරසිංහ ලා කෙසේ වෙතත් පුරවැසි සිංහයෝ දනිති. වියට්නාමයේ ප්‍රශ්නය සමග හෝ උතුරු අයර්ලන්තයේ ප්‍රශ්නය සමග හෝ ලංකාවේ ප්‍රශ්නය සංසන්දනය  කළහැකි නො වේ. උතුරු අයර්ලන්තය පමණක්  නොව වේල්සය ද ස්කොට්ලන්තය ද එංගලන්තයේ යටත්විජිත වෙයි. ඉංගිරිසින් මේ යටත්විජිත එක්කර  බ්‍රිතානිය, එක්සත් රාජධානිය ආදී නම් පටබැඳ ඇත්තේ ඒ යටත්විජිතභාවය වසන්කිරීමට ය.

බටහිරයන් මෙරට දී උත්සාහ කරන්නේ ඔවුන්ගේ ආධිපත්‍යය යොදාගනිමින් ඔවුන් ඇතිකළ ප්‍රශ්නයකට ඔවුන්ගේ පිළිතුරක් ලබා දීම ය. ප්‍රශ්නය ඇතිකළ පමණින් එයට පිළිතුරු ක්‍රියාත්මක කිරීමට බටහිරයන්ට අයිතියක් නැත. එහෙත් අද බටහිරයන්ගේ  මේ අධිපතිවාදී මැදිහත්වීම වෙනුවෙන් පෙනී සිටීමට මෙරට මාක්ස්වාදීහු පෙළ ගැසෙති. වාසුදේව නානායක්කාර හා ටෙරන්ස් පුරසිංහ මහත්වරු ඉන් දෙදෙනෙක් පමණක් වෙති. මාක්ස්වාදීන් බටහිරයන් වෙනුවෙන් පෙනී සිටීම ඇතැමුන්ට පුදුමයක් විය හැකි වුවත් මාක්ස්වාදයේ සම්භවය බටහිර මාක්ස්වාදීන් කියාදෙන ආකාරයට නොව අපේ ඇසින් බලන්නන්ට එහි කිසිම අරුමයක් නැත. මාක්ස්වාදය යනු වැළලී යන බටහිර වැඩවසම් කතෝලික චින්තනයෙහි උපත ලද දැනුම් පද්ධතියකි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට එරෙහිව සුළු සටනක් කළ නමුදු අද මාක්ස්වාදය පරාජය වී මිය යමින් සිටියි. පාප්වහන්සේට මෙන් ම මාක්ස්වාදී පාප්ලාට ද අද සිදු වී ඇත්තේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට සේවයකිරීම පමණකි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva